# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2453/37 - 2025 සැප්තැම්බර් මස 12 වැනි සිකුරාදා - 2025.09.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

යොමු අංකය: WGSWD & EIP/ACQ/MH/15.
කෘෂිකර්ම, ඉඩම්, පශු සම්පත් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ
යොමු අංකය: 4/3/10/2018/LRB/51.

වේරස් ගඟ වැසි ජල අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ, ජම්බුගස්මුල්ල මාවත හා ජම්බුගස්මුල්ල දෙවන පටුමග අවට ප්‍රදේශය හරහා ගලා යන වැසි ජලය මෙල්ඩර් පෙදෙස හා ෆීල්ඩ් මාවත අතර වැව දක්වා ගලා යාමට අවශ්‍ය කාණුවක් සකස් කිරීමට හා වැවෙහි නඩත්තු කටයුතුවලට මෙන්ම මහජනතාවට වැව දක්වා ගමන් කළ හැකි ප්‍රවේශ මාර්ගයක් ඉදිකිරීම සඳහා ඉඩම් කොටස් රජය වෙත අත්කර ගෙන ඇති බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*පවරා ගන්නා ලද ඉඩමේ විස්තරය :-*

කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 526 ඩී ජම්බුගස්මුල්ල ග්‍රාම නිලධාරී වසමේ ගංගොඩවිල (මහරගම නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කර ඇති කැඩැස්තර සිතියම් අංක 521428 කළාප 01 පත්‍ර 01 හි කැබලි අංක 01, 02 හා 03 ලෙස අංකනය කර පෙන්වා ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0296 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කොටස්.

01. කැබලි අංක 01

ඉඩමේ නම: —; විස්තරය: මාර්ගය; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: කේ. වී. ඩී. කේ. කේ. ගෝඨාභය මයා., අංක A13G1, මැනින් ටවුන් නිවාස සංකීර්ණය, මංගල පාර, බොරැල්ල. රංගිකා මධාරා වඩුගේ මිය., අංක 68/2, ජම්බුගස්මුල්ල මාවත, නුගේගොඩ; ප්‍රමාණය: හෙක්. 0.0213.

02. කැබලි අංක 02

ඉඩමේ නම: —; විස්තරය: සිමෙන්ති කාණුව; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: කේ. වී. ඩී. කේ. කේ. ගෝඨාභය මයා., අංක A13G1, මැනින් ටවුන් නිවාස සංකීර්ණය, මංගල පාර, බොරැල්ල. රංගිකා මධාරා වඩුගේ මිය. අංක 68/2, ජම්බුගස්මුල්ල මාවත, නුගේගොඩ; ප්‍රමාණය: හෙක්. 0.0010.

03. කැබලි අංක 03

ඉඩමේ නම: —; විස්තරය: සිමෙන්ති කාණුව; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: කේ. වී. ඩී. කේ. කේ. ගෝඨාභය මයා., අංක A13G1, මැනින් ටවුන් නිවාස සංකීර්ණය, මංගල පාර, බොරැල්ල. රංගිකා මධාරා වඩුගේ මිය., අංක 68/2, ජම්බුගස්මුල්ල මාවත, නුගේගොඩ; ප්‍රමාණය: හෙක්. 0.0073.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 ඔක්තෝබර් මස 22 වැනි දින පෙ. ව. 10.00 ට රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 03 දරන ස්ථානයේ ශ්‍රී ලංකා ඉඩම්



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

සංවර්ධනය කිරීමේ සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ පිහිටි ඉඩම් අත්කර ගැනීමේ කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2025 ඔක්තෝබර් මස 15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම්/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

**එච්. තිලකවර්ධන,**
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි
වේරස් ගඟ වැසි ජල අපවහන හා
පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය,
මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2025 සැප්තැම්බර් මස 09 වැනි දින,
වේරස් ගඟ වැසි ජල අපවහන හා
පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය,
අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

EOG 09 - 0100

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

යොමු අංකය: WGSWD&EIP/ACQ/KB/19.
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ
යොමු අංකය: 4/3/10/2013/LRB/108.

වේරස් ගඟ වැසි ජල අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ, පිළියන්දල උතුරු මාම්පේ පිහිටි හොරණ කොළඹ ප්‍රධාන බස් මාර්ගය හා පිළියන්දල මහරගම පාර අතර ඇති, අතහැර දමන ලද වෙල්යායේ ජල රක්ෂිතයක් සහ ඇළ මාර්ග සකස් කිරීම සඳහා ඉඩම් කොටස් රජයට පවරාගෙන ඇති බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*පවරා ගන්නා ලද ඉඩමේ විස්තරය :-*

කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 576 බී තුම්බෝවිල දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, තුම්බෝවිල ගමේ (කැස්බෑව නගර සභා සීමාව තුළ) පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කර ඇති 2024.02.12 දිනැති අංක 521203 කැඩැස්තර සිතියමේ 07 වැනි කලාපයේ පත්‍ර අංක 21හි දැක්වෙන, පහත අංකනය කර පෙන්වා ඇති බිම් කොටස.

1. **කැබලි අංක 01**

ඉඩමේ නම: ගරින්ද කුඹුර; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: දළවැල්ල හේවගේ සුහසිංහ මයා., අංක 329/B, කොළඹ පාර, පිළියන්දල; ප්‍රමාණය: හෙක්. 0.0045.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 ඔක්තෝබර් මස 22 වැනි දින පෙ. ව. 10.00 ට රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 03 දරන ස්ථානයේ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ පිහිටි ඉඩම් අත්කර ගැනීමේ කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2025 ඔක්තෝබර් මස 15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම්/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

**එච්. තිලකවර්ධන,**
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි
වේරස් ගඟ වැසි ජල අපවහන හා
පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය,
කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2025 සැප්තැම්බර් මස 09 වැනි දින,
වේරස් ගඟ වැසි ජල අපවහන හා
පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය,
අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

EOG 09 - 0101

---

ශුද්ධි පත්‍රය

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: WGSWD&EIP/ACQ/KB/18.
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ
අංකය: 4/3/10/2012/LRB/328.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ අංක 2258/51 හා 2021.12.17 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ඇතුළත් අංක 9839 මූලික පිඹුරේ කැබලි අංක 54 හා 66 සඳහා මවිසින් පළ කරන ලද 7 වන වගන්තිය යටතේ දැන්වීම අංක CO/DSO/2025/121 හා 2025.07.14 දිනැති අනුරේඛනය අනුව පහත පරිදි සංශෝධනය කරන බව මෙයින් දැනුම් දී සිටිමි.

1. **කැබලි අක්ෂරය A (කැබලි අංක 54 න් සංශෝධිත)**
ඉඩමේ නම: -; විස්තරය: වගුරු බිම; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: ජී. ඩී. පී. ගුණසේකර මයා., අංක 570, ගංගාරාම පාර, වේරහැර, බොරලැස්ගමුව; ප්‍රමාණය: හෙක්. 0.2944.

2. **කැබලි අක්ෂරය B (කැබලි අංක 66 න් සංශෝධිත)**
ඉඩමේ නම: වද්දුවකුඹුර, කරදියානවත්ත, කෝන්ගහවත්ත *හෙවත්* ගල්පොත්තේවත්ත, පදුක්කකුඹුර සහ වියදන්දවල කුඹුර; විස්තරය: වගුරු බිම; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: ජී. ඩී. පී. ගුණසේකර මයා., අංක 570, ගංගාරාම පාර, වේරහැර, බොරලැස්ගමුව; ප්‍රමාණය: හෙක්. 1.0935.

**එච්. තිලකවර්ධන,**
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී
වේරස් ගඟ වැසි ජල අපවහන හා
පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය,
කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2025 සැප්තැම්බර් මස 11 වැනි දින,
වේරස් ගඟ වැසි ජල අපවහන හා
පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය,
අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

EOG 09 - 0102